
## එදිනෙදා ජීවිතයට විද්‍යාව

# ව්‍යාජ ඖෂධ ජාවාරම

**ආචාර්ය උපාලි ඇම්. සේනානායක**

ශ්‍රී ට සියවස් 04 කට පමණ පෙර අප විසින් යම් භාණ්ඩයක් මිලදී ගන්නා විට එය සියයට සියයක්ම නියම (Genuine) භාණ්ඩ බවට සැකයක් නොමැති විය. එය ඖෂධයක්, සාමාන්‍ය විදුලි උපකරණයක්, ඔරලෝසුවක් නැත්නම් වාහන අමතර කොටසක් විය හැක. එහෙත් අද තත්ත්වය මීට බොහෝ වෙනස් ය. පසුගිය වසර දහය තුළ බොහෝ අනුකරණ (ව්‍යාජ) ද්‍රව්‍ය වෙළෙඳ පොළට පැමිණ ඇත. අද අප මිලයට ගන්නා ඖෂධයක්, (බටහිර හෝ ආයුර්වේද) විදුලි උපකරණයක් ඔර්ලෝසුවක් එසේත් නැත්නම් සංගීත කැසට් පටයක් කොතරම් දුරට නියම එකදැයි දැනගැනීමට අපහසුය. නියම ජ්ජන්ත වෙළෙඳුන් පවා නියම වෙළෙඳ භාණ්ඩය විකුණනු සැකසහිත අවස්ථා ඇත. නියම උපකරණ අනුකරණය කිරීම අද සාමාන්‍ය දෙයකි.

විදුලි පරිපථ විසන්ධි කරන ට්‍රිප් ස්විච් උපකරණ නිපදවන සමාගම් ගණනාවක් ඇත. මේවා ප්‍රසිද්ධ වෙළෙඳ නාමය යටතේ විකුණනු ලබන අතර එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව සහතිකයක් ද දෙනු ලබයි. මෑතකදී සිදුවුන විදුලි පරිපථ විසන්ධි නොවීම නිසා හට ගත් ගිනිගැනීම් පරීක්ෂා කිරීමේදී පෙනී ගොස් ඇත්තේ එම ට්‍රිප් ස්විච් නියම ඒවා නොව අනුකරන බවයි. උසස් වර්ගයේ රූපවාහිනී යන්ත්‍ර නිපදවන්නේ බටහිර ජර්මනියේ බව පිළිගැනීමක් ඇත. මීට වසර කීපයකට පෙර 'නිව්ස් වීක්' සඟරාවේ පළවූ පුවතක් අප ඇස් අරවන්නට සමත් විය. යම් කිසි දෝෂයක් නිසා රූපවාහිනිය ක්‍රියාවිරහිත විය. අලුත්වැඩියා කරන සමාගමකට එය භාරදී විවෘත කරන විට එහි තිබුණේ නෙවත ලෝකයේ රටක නිපදවන ලද ගුණාත්මක තත්ත්වයෙන් අඩු රූපවාහිනී තලයක් විය. මෙම පුවත කොතරම් තදින් බලපෑවේදයත් එම සමාගම බංකොලොත් විය. මෙය ජර්මනියේ 'ටිලිෆන්කන්' සමාගම විය. පසුගිය වසරේදී අනුකරණවලට විරුද්ධව චීනය යුද්ධයක් ප්‍රකාශ කළේ ය. ලෝ ප්‍රකට රොලෙක්ස් ඇතුලු ඔරලෝසු අනුකරණ, වීඩියෝ සහ සංයුක්ති තැටි ආදිය බිම අතුරා ගල් රෝල් මගින් තලා විනාශ කරනු ලැබිය.



ඖෂධයකින් බලාපොරොත්තු වන්නේ රෝගය සුවකිරීමකි. නැත්නම් පාලනය කිරීමකි. මේ දෙකම සිදු නොවේ නම් අසරණ රෝගියා මිය යයි. නොඑසේනම් යළිත් සුව කළ නොහැකි මහා විනාශයක් සිදු වෙයි.

කාරණා මෙසේ වුවත් අනුකරණ භාණ්ඩ ව්‍යාප්ත වීමට හේතු ගණනාවක් වෙයි. අප දන්නා පරිදි නියම භාණ්ඩ සහ අනුකරණ භාණ්ඩ අතර මිලෙහි විශාල වෙනසක් ඇත. අනුකරණ භාණ්ඩය නිතරම මිලෙන් ලාභ වෙයි. කෙටිකාලීන භාවිතය සඳහා නම් මෙය ප්‍රශ්නයක් නොවෙයි. එහෙත් දිගුකාලීන භාවිතය සඳහා නම් ප්‍රශ්නයක් වෙයි. බොහෝවිට යම් අමතර කොටස් මෙලෙස යොදවන විට එය එකතු කළ යන්ත්‍රය ම විනාශවීම දක්නට පුළුවන. ඇතැම් ඉලෙක්ට්‍රොනික කොටස් මෙලෙස එකතු කළ විට මුළු යන්ත්‍රයම ගිනිගෙන විනාශ වූ අවස්ථා ගණනාවක් ඇත. නියම කොටස් සොයා ගැනීමට නොහැකි විට, මිල අඩු අනුකරණ කොටස් දැමීමත් බොහෝවිට සිදු වෙයි.

අප මෙම ලිපියෙන් උත්සාහ කරන්නේ ඖෂධ අනුකරණය කිරීමත් ඉන් සිදුවන විනාශයත් ගැන කරුණු පෙන්වීමට ය. ඖෂධයකින් බලාපොරොත්තු වන්නේ රෝගය සුවකිරීමකි. නැත්නම් පාලනය කිරීමකි. මේ දෙකම සිදු නොවේ නම් අසරණ රෝගියා මිය යයි. නොඑසේනම් යළිත් සුව කළ නොහැකි මහා විනාශයක් සිදු වෙයි. මෙය දුක්ඛිත තත්ත්වයකි.

ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)විසින් අනුකරණ හෝ හොර ඖෂධ යනු කුමක්දැයි නිර්වචනය (Definition) කර ඇත. ඕනෑකමින් ම සහ කූට අන්දමට එහි ප්‍රභවය, ආරම්භය හෝ සොයා ගැනීමට නොහැකි වන අන්දමට ලේබලය වෙනස් කිරීම එකකි. මෙය වෙළෙඳ නාමය සහ ජෙනෙරික් (Generic)නාමය යන දෙකටම අදාළ වෙයි. ඇතැම් විට එම ඖෂධයේ නියම රසායන නියම මාත්‍රාවෙන් තිබිය හැක. වැරදි රසායන, නියම සක්‍රියතාවයක් නැති රසායන, සක්‍රිය රසායන අඩුවෙන් තිබීම, එසේත් නැතිනම් අනුකරන ලේබල් ඇලවීම ආදිය ලෙස එම නිර්වචන දී ඇත.


භාණ්ඩ ඇසුරුම් පෙට්ටිය වඩාත් දැකුම්කළු ලෙස නිර්මාණය කිරීම බොහෝ අනුකරණ හෝ ව්‍යාජ භාණ්ඩ ආකර්ෂණීය කිරීමට එක් හේතුවකි. මෝටර් රථ අමතර කොටස් ඇසුරුම් පෙට්ටි ගැන

මෑතකදී දැනුවත් කිරීමක් පුවත්පත් සහ රූපවාහිනිය මගින් ප්‍රචාරය කරන ලදී. බැලූ බැල්මට දෙකේම ඇසුරුම් පෙට්ටි එක හා සමාන විය. පාරිභෝගිකයින්ට තෝරා ගැනීමට අවස්ථාවක් සැලසූ විට ඔවුන් තෝරා ගත්තේ අනුකරණ ඇසුරුම යි. ඖෂධ ගැන ද මේ ලෙස ම කිව යුතු ය. පෙනුමෙන් සිත් ඇදගන්නා නිසාත්, මිලෙන් පහළ නිසාත් බොහෝ අඩු ආදායම් පාරිභෝගිකයෝ ව්‍යාජ ඖෂධ මිලදී ගැනීමට හේතු වී ඇත.

ඖෂධ නිෂ්පාදනයේ දී අනුගමනය කළ යුතු නීතිරීති ගණනාවක් වෙයි. මෙය යුරෝපයේ රටවල පමණක් නොව ශ්‍රී ලංකාව තුළ ද ඇත. එකක් වන්නේ හොඳ නිෂ්පාදන ක්‍රියාවලිය යි. මෙය ව්‍යවස්ථාවල Good Manufachering Practive GMP නමින් හඳුන්වා ඇත. නියම අමුද්‍රව්‍ය නිසි පමණ මාත්‍රාව යොදා සෞඛ්‍යදායකව නිපදවීම මෙහි එක් අවශ්‍යතාවකි. ව්‍යාජ හෝ අනුකරණ ඖෂධ නිපදවන්නෝ මෙම නියමය එලෙසම ක්‍රියා නොකරති. මක්නිසාදයත් ඔවුන් ලබන ලාභාංශ අඩු වීම නිසා ය. මෙය තෙවන ලෝකයේ ඒජන්සි ආයතන විසින් ද කරනු ලැබේ. ඇමෙරිකා සහ යුරෝපීය රටවල කම්කරු ශ්‍රමය මිල අධික ය. මේ නිසාම ප්‍රසිද්ධ වෙළෙඳ නාමයක් ඇති බොහෝ ඖෂධ ආසියාතික රටවල, ඒජන්සි ආයතනය මගින් නිපද වේ. වත්මන් සමීක්ෂණ අනුව පෙනී යන්නේ මෙම බොහෝ ඖෂධවල නියම මාත්‍රාව සැක සහිත බව ය.

මීට හේතු දෙකක් සඳහන් වේ. මාතෘ ආයතනයේ නිසි අධීක්ෂණය යටතේ, නියම තත්ත්ව පාලනයකින් කරන්නේ නම් මෙය ප්‍රශ්නයක් නොවේ. ඇතැම් ඖෂධ (පෙති, කරල්, සිරප් ගෘහස්ත කර්මාන්ත ලෙස ද නිපදවනු ලබයි. විශේෂයෙන් ම පෙති, කරල් වැනි පිටි මාධ්‍යයක් තුළ ඇති ඖෂධ මිශ්‍ර කිරීම නිසි පරිදි සිදු නොවේ. අලුත් යන්ත්‍ර මගින් මිශ්‍ර කරනු වෙනුවට, ඇතැම්විට වංගෙඩි මෝල්ගස් මගින් ද මෙය කරනු ලැබේ. යාන්ත්‍රිකව පෙති හෝ කරල් තුළට බෙහෙත් කුඩු දමනු වෙනුවට මේවා විවෘත පරිසරයක අතින් ම කරනු ලබයි. බාහිර අපද්‍රව්‍ය පමණක් ම නොව කම්කරුවන්ගේ ප්‍රශ්වාස වාතය සහ රෝගකාරක විෂබීජ ද මෙම ඇසුරුම් තුළට එකතු විය හැක.

පෙත්තක්, හෝ කරලක ඇත්තේ නියත බරකි. එය තුළ ඖෂධ නියම මාත්‍රාව තිබිය යුතු ය. නොඑසේ නම් රෝගය සුවවීමක් නොවීම හෝ ප්‍රමාදවීමක් සිදු වෙයි. බොහෝ තෙවන රටවල නිපදවන ප්‍රතිජීවක ඖෂධවල ගුණාත්මකභාවය පිළිබඳව ප්‍රශ්න ඇති වී තිබේ. වෛද්‍යවරු නියම කරන ඖෂධ පෙති හෝ කරල් මගින් රෝග සුව නොවීම මීට හේතුවයි. අභාග්‍යයකට මෙන් මෙම බොහෝ ඖෂධවල, ප්‍රසිද්ධ වෙළෙඳ නාමය විශාල අකුරෙන් පිටකවරයේ මුද්‍රණය කර ඇත. ඇත්ත වශයෙන් ම ඖෂධය නිපදවූ හෝ ඇසුරුම් කළ රට කියවීමටත් අපහසු කුඩා අකුරින් ඇසුරුම මත මුද්‍රණය කර ඇත.



පෙත්තක්, හෝ කරලක ඇත්තේ නියත බරකි. එය තුළ ඖෂධ නියම මාත්‍රාව තිබිය යුතු ය. නොඑසේ නම් රෝගය සුවවීමක් නොවීම හෝ ප්‍රමාදවීමක් සිදු වෙයි.

බොහෝ වෛද්‍යවරු තම රෝගියාට පිටතින් බෙහෙතක් ගන්නා විට, හැකි සෑම විටකම මාතෘ සමාගම විසින්ම නිපදවන ලද ඖෂධ ගැනීමට නිර්දේශ කෙරේ. එලෙසම ප්‍රසිද්ධ ආරෝග්‍යශාලා සහ ඔසුහල් යොදා ගන්නේ හෝ අලෙවි කරන්නේ මාතෘ සමාගම් විසින් නිපදවන ලද (Original) ඖෂධ වර්ග පමණි.

ඖෂධවල ගුණාත්මක භාවය සොයා බලන එක් සමාගමක් වන්නේ ගරාටු ජාත්‍යන්තර (Garratu International) නම් එක්සත් රාජධානියේ ඇති සමාගම යි. ඖෂධ අනුකරණ හෝ ව්‍යාජ (Fake) සහ පේටන්ට් අයිතින් උල්ලංඝනය පිළිබඳ නීතිමය පැත්ත සහ සොයාබැලීම් මෙම ආයතනය විසින් කරනු ලැබේ. එහි ඖෂධ තත්ත්වය පාලනය ගැන සොයාබලන කළමනාකරු ජෝන් ඇලන් පවසන්නේ ඇතැම් ඖෂධවල පිරවුම් (Fillers)ද්‍රව්‍ය ලෙස යොදාගන්නේ රටහුණු කුඩු, පිටි සහ ගඩොල් කුඩුයි. පළමු දෙවර්ගය ඖෂධයේ පරිමාව විශාලකර ගැනීමටත්, ගඩොල් කුඩු වර්ණයක් කැවීම පිණිසත් යොදා ගැනේ.

කවුන්ටරය මත මිලදී ගන්නා ව්‍යාජ හෝ අනුකරණ ඖෂධ දෙවිධියකින් විනාශයක් කරයි.

ඖෂධය පාවිච්චි කරන්නාට රෝගය සුව නොවීම එක් කරුණකි. නියම ඖෂධ නිපදවන මාතෘ සමාගම් වලට ලැබෙන ආදායම් 'මංකොල්ල'කෑම නිසා ඔවුන්ට ලැබිය යුතු විශාල ධන සම්භාරයක් අහිමිවීම අනින් කරුණයි. අනින් එක ඔවුන්ගේ බුද්ධි අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමයි.

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 1982 සිට 1997 දක්වා කරන ලද සමීක්ෂණවලින් පෙනී ගියේ ලොව වටා රටවල් 25 ක මෙම ව්‍යාජ ඖෂධ වර්ග ඇති බවයි. මෙම සංඛ්‍යාවෙන් සියයට 25 ක් සංවර්ධනය වූ රටවලිනුත්, සියයට 65 ක් සංවර්ධනය වෙමින් පවතින රටවලිනුත් සියයට 10 ක් ආරම්භය හෝ ප්‍රභවය කුමක්දැයි නොදන්නා රටවලින් මූලාරම්භය වී ඇති බවයි. මෙම රටවල් අතුරෙන් නැගෙනහිර යුරෝපයේ රටවල් සහ ඉන්දියාව නම් වශයෙන් සඳහන් කර ඇත. කරාතු ආයතනය වාර්තා කරන අන්දමට මධ්‍යම සහ දකුණ ඇමෙරිකාව, මෙක්සිකෝව තුළ මෙම ව්‍යාජ වෙළෙඳපොල බහුලව ඇත. ලිංගික දුබලතාවයෙන් පෙළෙන අයට මෑතකදී හඳුන්වා දුන් ව්‍යාග්‍ර නම් ඖෂධය මිල අධික එකකි. ලංකාවේ මුදලින් මිලි ග්‍රෑම් 50 ක පෙත්තක් රුපියල් 800 කට අධික ය. එම නියම ඖෂධය ම, අඩු මාත්‍රාවක් ඇති පෙත්තක් 25% අඩු මුදලකට සපයන රටක් වශයෙන් මෙක්සිකෝව ප්‍රසිද්ධ ය.

ඇමෙරිකාවේ ඖෂධ අධිකාරිය (FDA)විසින් මෙම ව්‍යාජ ඖෂධ නිපදවන ක්‍රියාදාමය අධ්‍යයනය කර ඇත. පළමුවෙන් ම කරන්නේ ඖෂධයේ ඇති නියම රසායන ද්‍රව්‍ය හොර ඖෂධාගාරයක නිපදවීම යි. මේ සඳහා පළපුරුදු රසායන විද්‍යාඥයන්ගේ සහාය පවා ලබා ගනී. ඒවා පෙති හෝ කරල් බවට පත් කර අසුරන්නේ බොහෝ දෙනෙකුට සොයාගත නොහැකි හොර මධ්‍යස්ථානයකයි. එලෙස නිපද වූ ඖෂධ ඊළඟට යවන්නේ හොර ඇසුරුම් මධ්‍යස්ථානයකටයි. මූලික ඖෂධ ඇසුරුම් පෙට්ටි හා සමාන හෝ ඊටත් වැඩියෙන් හොඳ නිර්මාණය කළ හැකි ශිල්පීහු මෙහි සේවය කරති. බැලූ බැල්මට මෙය නියම නිෂ්පාදනයක් ලෙස පෙනේ. එය නිපදවූ රට පවා මුල් අයිතිකරුගේ නම සහ රට සඳහන් වෙයි. එලෙස නිෂ්පාදිත ඖෂධ වර්ග තොග සහ සිල්ලර වශයෙන් බෙදා හැරීම ඊළඟ පියවර යි. මෙය කිරීමට ඒජන්සිකරුවන් සමග සහයෝගයෙන් ක්‍රියා කරන අවස්ථා ද ඇත. මිලදී ගන්නාට නියම සහ ව්‍යාජ යනුවෙන් හඳුනා ගැනීමට බැරිවීම නිසා ව්‍යාජ ඖෂධ

නොදැනුවත්වම පාරිභෝගිකයා අතට පත්වෙයි. FDAආයතනය පවසන අන්දමට නියම සහ ව්‍යාජ ඖෂධයක් හඳුනා ගැනීමට ඇති එකම ක්‍රමය රසායනාගාරයක් තුළ විශ්ලේෂණ කිරීම මගින් පමණ ය.

FDAආයතන සහ එක්සත් රාජධානියේ ඖෂධ පාලන ආයතනය MCAමෙම ව්‍යාජ ඖෂධ සොයා බලන අංශ වලින් සැදී ඇත. එබඳු ව්‍යාජ ඖෂධයක් සොයා ගත් විට නීතිමය පියවර ගැනීමට ඔවුන්ට බලයක් ඇත. යම් ඖෂධයක් ව්‍යාජ ඖෂධයක් බවට ඉක්මන් පර්යේෂණාගාර විශ්ලේෂණ ක්‍රම මගින් සොයාගත්තත් එය තහවුරු කිරීමට මාප ගණනක් පරීක්ෂණ කළ යුතු ය. මෙය හඳුන්වනු ලබන්නේ 'ඇඟිලි සලකුණ' ස්ථාපනය කිරීම යනුවෙනි. ව්‍යාජ සහ නියම ඖෂධ විශ්ලේෂණ ගැලපුම හරියට ම තහවුරු වනතුරු නීතිමය ක්‍රියාවක් නො ගනී.

එක්සත් රාජධානියේ කරාතු ආයතනය පවසන්නේ යම් රසායන අමුද්‍රව්‍ය ඉල්ලුමක් යම් තැනක වැඩියෙන් ඇත්තම් ව්‍යාජ ඖෂධ නිපවීම ගැන ඉඟියක් ඉන් ලබා ගත හැක. උදහරණයක් ලෙස ලිංගික උත්තේජක ව්‍යාජ ඖෂධය හොර රහසේ ඉන්දියාවේ නිපදවන බව එය නිපදවීමට ගන්නා 'සිල්ඩෙනපිල් සිට්රේට්' විශාල තොග එහිදී සොයා ගැනීමෙන් තහවුරු විය.

තායිලන්තය ද මෙබඳු ඉල්ලුමක් ඇති ඖෂධ හොර රහසේ නිපදවන බවට තොරතුරු ලැබී තිබේ. මෙබඳු තැන්වලින් ලබාගත් ඖෂධ පිළිගත් රසායනාගාර තුළ කළ විශ්ලේෂණ වලින් තැනී ගන්නා තොරතුරු අනාවරණය වී ඇත. විශ්ලේෂණය කරන ලද ඖෂධවලින් නියම මාත්‍රාව 50% පමණ නොවී ය. මෙබඳු ඖෂධ ගැනීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැක.

කෙසේ වෙතත් හොර ඖෂධ ජාවාරම වෙනත් හොර බඩු ජාවාරම් මෙන්ම පාලනය කළ නොහැකි දෙයකි. ලෝකයේ බොහෝ ආයතන මේවා පාලනය කිරීම සඳහා කටයුතු කරනු ලබයි. තමාගේ ප්‍රවේසම සඳහා නියම අනුමත ඒජන්සි මගින් ඒවා මිලදී ගැනීම වඩාත් හිතකර ය.

***Chemistry in Britain***

*සඟරාව ආශ්‍රයෙනි)*